# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

| 4 ශ්‍රේණිය | මව්බස | කාලය : පැය 01 මිනිත්තු 30 |
|---|---|---|

නම ..........................................................................................................................

(01). පහත දැක්වෙන ඡේදය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තෝමස් අල්වා එඩිසන්ට දිගු කලක් පාසල් අධ්‍යාපනය ලැබීමට තරම් ඉඩක් ලැබුණේ නැතත් ඔහු ඉගෙනීම නතර නොකළේ ය. තම මවගේ උදව්වෙන් කියවීම ඉගෙන ගත්තේ ය. කියවීම ගැන ඔහු විශේෂ උනන්දුවක් දැක්වීය. එඩිසන්ගේ සිත විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳව යොමු වූයේ විද්‍යාව පිළිබඳ පොත් කියවීමෙනි. විද්‍යා පොත් කියවා ඒවායේ සඳහන් පරීක්ෂණ අත්හදා බැලීම එඩිසන්ගේ පුරුද්දක් විය.

1. එඩිසන් විශේෂ උනන්දුවක් දැක්වූයේ කුමක් සඳහා ද? ..........................................................
2. විද්‍යාව පිළිබඳ පොත් කියවීමෙන් ඔහුගේ සිත යොමු වූයේ කුමක් සඳහා ද?

   ..........................................................................................................
3. ඔහුට ඉඩක් නොලැබුණේ කුමකට ද? ..........................................................
4. ‘දිගු කලක්’ මෙහි විරුද්ධාර්ථ පදය ලියන්න. ..........................................................
5. ‘<u>විද්‍යා</u>’ යන වචනයේ ඇති පිල්ලම් නම් කරන්න. ..........................................................
6. මූර්ධජ අකුරක් සහිත වචන 2 ක් ඡේදයෙන් සොයා ලියන්න. ..........................................................
7. මෙහි සඳහන් අප්‍රාණවාචී බහුවචන නාම පදයක් ලියන්න. ..........................................................
8. අම්මාගේ යන්නට සමානාර්ථ පදයක් ඡේදයෙන් සොයා ලියන්න. ..........................................................
9. ‘ඔහු විශේෂ උනන්දුවක් දැක්වීය.’ මෙම වැකිය බහුවචනයට හරවා ලියන්න.

   ..........................................................................................................
10. ඒකවචන පදය ලියන්න. පරීක්ෂණ ....................................

(ලකුණු 10)

(02). සුදුසු විරාම ලකුණු යොදන්න.

1. සඳරුවන් අලුත් යෝජනාවක් ගෙනාවේ ය
2. ඉත්තෑරාල ඔබ කොහොමද මේ පොල්ලේ බලේ නැතුව ඉන්නේ

(ලකුණු 04)

(03). කෙටි යෙදුම් විස්තර කර ලියන්න.

1. උ.මැ.ප. ..........................................................
2. ප.ව. ..........................................................

(ලකුණු 02)

(04). දී ඇති පද ගළපා අර්ථවත් වැකි සාදන්න.

1. නිර්මාණ/නොව/අලුත්/විදුලි/රැසක්/කළේය/හෙතෙම/පමණක්/බිහි/තවත්/බුබුළ

..........................................................................................................................................

2. පඳුරු/සරුවට/පොළොවේ/මල්/වගෙයි/පෙනෙන්නේ/වැඩුණු/කෝලියාස්/ඇතිරූ/සැරසිල්ලක්

..........................................................................................................................................

(ලකුණු 04)

(05). පහත යෙදුම්වල අදහස ලියන්න.

1. ඇස නොපියා ............................................................

2. මුහුණට දිය දී ............................................................

3. අතේ ගැවෙන නොගැවෙන තරමට ............................................................

4. තැත් කරයි ............................................................

5. බාගදා ............................................................ (ලකුණු 05)

(06). දී ඇති පිල්ලම් යෙදෙන වචන 2 බැගින් ලියන්න.

1. ඇදපිල්ල .................................. ........................................

2. දීර්ඝ පාපිල්ල .................................. ........................................

3. රකාරාංශය .................................. ........................................

4. යංශය .................................. ........................................

5. කොම්බු දෙක .................................. ........................................ (ලකුණු 10)

(07). පහතින් ලියා ඇත්තේ සදොස් වචන කීපයක් ඒවා නිවැරදි කර ලියන්න.

1. කෙලවර ය ........................................

2. පතිහිම්බය ........................................

3. රිජු රේඛාව ........................................

4. කුමිනාෂක ........................................

5. වළිකුකුලන් ........................................ (ලකුණු 05)

(08). පහතින් දී ඇති වාක්‍යවල ඉරිඇඳි පදයට ගැළපෙන සමානාර්ථ පද යොදා වාක්‍ය නැවත ලියන්න.

1. වර්ෂා කාලයට <u>බැද්ද</u> සැපදායක ය. ............................................................

2. ඔහු <u>හුදකලාව</u> සිටීමට ප්‍රියකරයි. ............................................................

3. ඉත්තෑවා වෘකයාට <u>වැරෙන්</u> පහරක් ගැසීය ............................................................

4. අඹ <u>තුරු</u> අතු පතරේ රස පල හිනැහෙයි ............................................................

5. <u>තුෂර බිඳු</u> කොළ මත වැටී දිළිසෙයි ............................................................

(ලකුණු 05)

(09). වරහන් තුළ ඇති පද අතරින් විරුද්ධාර්ථ අදහස ප්‍රකාශවන පද තෝරා රවුම් කරන්න.

1. (තිත්ත , අමිහිරි , තියුණු , මිහිරි , දැඩි)
2. (වතුර , ජලය , දක්ෂ , සමර්ථ , අදක්ෂ)
3. දුරස්ථ , ප්‍රස්තාර , පහසු , අපහසු , දුර)
4. (ඇත්ත , පැත්ත , සත්‍ය , සතය , අසත්‍ය)
5. (විවෘත , ඇරුණු , විවර , සංවෘත , කෘතහස්ත) (ලකුණු 05)

(10). පද වෙන්කර ලියන්න.

1. පාරදෙපැත්තේමටර්පන්ටයින්ගස්සරුවටවැවීතිබුණා

.....................................................................................................................................................

2. මිනිසුන්පුදුමකරවනදේනිපදවන්නටඑඩිසන්සමත්වූයේමේවැඩකිරීමේපුරුද්දනිසාය

..................................................................................................................................... (ලකුණු 06)

(11). යුගල පද සම්පූර්ණ කරන්න.

1. ................ දොර
2. මිල ................
3. පොත ................
4. රන් ................
5. ................ දෙනු (ලකුණු 05)

(12). දී ඇති ප්‍රස්තා පිරුළ සම්පූර්ණ කරන්න.

1. කබලෙන් .............................. වැටුණා වගේ
2. කටුස්සගේ .............................. රන් බැන්දා වගේ (ලකුණු 02)

(13). පහත සඳහන් වගන්ති සම්පූර්ණ කිරීම සඳහා සුදුසු උක්ත, ආඛ්‍යාත පද යොදන්න.

1. අධික වර්ෂාව නිසා නගර සියල්ල ම විනාශ .............................
2. ඇ කඩිසර ගමනින් පන්තියට .............................
3. ............................. අවසර පත් ලබාගෙන ඇවිදින්නට පටන් ගත්තෙමු.
4. කළු වලාකුළු අහස පුරා දකින්නට .............................
5. ............................. සිදුරු කැමරාවක් සාදයි.
6. මේ නිර්මාණ දුටු මිනිස්සු ඔහුට ප්‍රශංසා .............................
7. වසු පැටවකුගේ හඬ ඇතින් .............................
8. ............................. වැස්සට පෙර වෙලෙන් ගොඩට ආවෝය.
9. ............................. දර කැඩීමට වනය තුළට ගියහ.
10. ඇතැම් මල් උදයට පිපී සවසට ............................. (ලකුණු 10)

(14). ඔබගේ තොරතුරු ඇතුළත් කරමින් පහත ආකෘති පත්‍රය සම්පූර්ණ කරන්න.

**ආකෘති පත්‍රය**

සම්පූර්ණ නම : ....................................................................................................

උපන් දිනය : ....................................................................................................

ඉගෙනුම ලබන පාසල: ..........................................................................................

මවගේ නම : ....................................................................................................

පියාගේ නම : ....................................................................................................

නිවසේ ලිපිනය : ....................................................................................................

(ලකුණු 06)

(15). පහත කවියේ හිස්තැන සම්පූර්ණ කරන්න.

1. පෙරදිග මුතු ඇටය ලෙස ලොව පසිදු වුණ
   දම් දිවයිනකි මෙය පෙර සිට පැවත එන
   ....................................................................................................
   යුග යුතුකමට දැන් අත්වැල් බඳිනු මැන
2. ඉහත කවිය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද? ..........................................................................
3. එහි රචකයා කවරෙක් ද? .......................................................................... (ලකුණු 09)

(16). කැමති මාතෘකාවක් යටතේ උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය නිවැරදිව යොදා එක් වැකියකට වචන 6ක් වත් ඇතුළත් වැකි 6 ක් ලියන්න.

1. සීතල නුවරඑළියේ ගෙවුණු දවසක්
2. කුරුළු කූඩුවක් බිම වැටිලා
3. සිරිසැපදෙන සිරිලංකා දීපේ
4. ගැමුණු රජුන්ගේ කාලේ මා සිටියා නම්
5. සැඳෑ අඳුර ලොව ගලන වෙලාවේ

(ලකුණු 12)

1. ....................................................................................................
   ....................................................................................................
2. ....................................................................................................
   ....................................................................................................
3. ....................................................................................................
   ....................................................................................................
4. ....................................................................................................
   ....................................................................................................
5. ....................................................................................................
   ....................................................................................................
6. ....................................................................................................
   ....................................................................................................